




මගෙ සඳ ඔබ - මගේ සඳ ඔබට
එදු සඳ නොව මදු සඳ ඔබ
මගේ සඳ ඔබ මගේ . . . .

එදා මට ඔබ සරා සඳ විය
කවි ඇසින් දුටු සොඳුරු පියකරු
අඳුරු හද ගැබ එකලු කරමින්
උදු විය ගිර ශිඛර සිරසේ . . . !

මෙදු මට ඔබ සැබෑ සඳ මය
විදු ඇසින් දුටු ලොව ය විෂකුරු
ප්‍රාණයෙන් තොර වියළි සඳ සේ
ඔබ ද අද මා අසළ ගැවසේ . . .!

# "මගේ සඳ ඔබ"

ඔව් බිමේ හෙළ ගී කෙතේ කන්නයෙන් කන්නයට, වසරින් වසරට, යුගයෙන් යුගයට පූදින සරු අස්වැන්න පිළිඳව අප කතා කරන්නේ සතුටින්, අතරවාරයේ ගොයම වසා පැතිරෙන තුන්හිරියා, නියර පුරා පැලවෙන තුත්තිරියා ඉවත ලා සරු යමක් පිළිබඳව කතා කිරීමට ලැබෙනවානම් "ගී සදළුවේ" ඉඩකඩ ඊට නිරන්තරයෙන් වෙන් වෙනවා.

ඉඳහිටක සිදුවන සුහද දුරකථන පිළිසඳරක දී වුව සුභාරංචියක කන වැකුණ විගසින් සිහිපත් වන්නේ "ගී සඳළුව" පාඨකයන්මයි. මේ එවන් සුභාරන්චියක් නොවේ ද පාඨකයින්ට?

"සිසිර මගේ සී.ඩී. දෙකක් එළිදක්වනවානේ දහ නවවෙනීදු . . . ."

දුරකථනයෙන් අපව මව්බිමේ සිට දැණුවත් කළේ විශාරද නන්දමාලිනියයි.

"මම චිත්‍රපටවලට ගායනා කරපු සින්දු තිස් දෙකක් ම පහුගිය වතාවල ආයෙ කළානෙ සී.ඩී. දෙකකට. ඒ වයේ ඇතුලත් නොවුණ චිත්‍රපටි ගීත තවත් සින්දු තිස් දෙකක් කුලේ ගේ "ගිගිරි" සී.ඩී ලකුණින් එළි දැක්වෙනවා. "

නන්දු මාලිනියගේ සිනමා පට වෙනුවෙන් ගැයුණ ගී ඇතුලත් "රන්කෙන්දෙන් බැඳ" සහ "ඈත කඳුයායේ" සංගත තැටි මින් පෙර දෙවතාවක දී රසිකයින් අතට පත් විණ. සංගත තැටි යුගලයක් ලෙසින් මෙවර එළිදැක්වීමේ සද්කාර්යයට කරදෙන්නේ කුලරත්න ආරියවංශ ප්‍රවීණ ගේය පද රචකයායි. නන්දු මාලනිය "කුලේ" නමින් හැඳින්වූයේ අරිවංශයන්ව යි. සැබැවින් ම මෙය සද්කාර්යයක් වන්නේ කෙළෙසින් ද?

"මේ තැටි දෙකට ඇතුලත් වෙලා තියෙන්නෙ මීට අවුරුදු හතළිහකට විතර උඩදි ගායනා කරපු ගීත. මේ අතරේ ඉතාම ජනප්‍රිය සින්දු වාගෙම සම්මාන ලැබුණ ගිතත් තියෙනවා. ඒ වුණත් අද මේවා අහන්න ලැබෙන්නෙ නෑ. මොකද අද වෙනකොට මේ ගීත විතරක් නෙවෙ යි චිත්‍රපටි පවා හොයාගන්න නෑ. සංරක්‍ෂණය වුණේ නෑනෙ හරියට..."

"ඉතින් ඇත්තට ම මේ ගීත මොන විදියකින් හරි සංරක්ෂණය සාරවත් යුගයක සුවඳ දනන්නට යි මේ වෑයම"

"මේ චිත්‍රපට වගේම මේ දේවල් වල නිර්මාතෘවරුන් බොහොම දෙනෙක් අද අපි අතර නෑ. ඒඅ ය කරපු-කියපු දේවල් කොතැනකවත් ලියැවිලාත් නැතිව ඇත. අළුත් අයත් මේ දේවල් වළී වි. ඒඅ යත් දැණුවත් වේවි. අපේ පැරැන්නන්ගේ දේවල් ගැන උනන්දු වෙන අයට හොඳ පිටිවහලක් වේවි.."

අපගෙ මේ කතිකාවට කුලරත්න ආරියවංශයන් ද සම්බන්ධ කර ගත්තෙමු.

"සැප්තැම්බර් මාසෙ දහනව වැනිදු පටන් ගන්න ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පවත්වන කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී තමයි මේ උත්සවය පවත්වන්න කටයුතු යොදලා තියෙන්නෙ..." ආරයවංශයන් අප හා දුරකථනයෙන් එක් වීය.

"අපි සී.ඩී. දෙක නම් කරලා තියෙන්නේ "දේදුනු පායා" කියලයි."මහ ගිරි අරණේ" කියලයි. ඇත්තටම ගීත තෝරාගෙන ඇතුලත් කරලා තියෙන්නෙ අළුත් පරම්පරාවට මේ යුගය ගැන හරස්කඩක් දකින්න පුළුවන් වෙන විදියට. මේ දේවල් එක් රැස් කරලා තියන එකේ වටිනාකම අපිට දැනුනා."

මුදල් හඹා යමින් ගී එකතු එළිදැක්වෙන කළියුගයක මෙවන් කාර්යයක් යුගයේ අවශ්‍යතාවයක් බවට පත් වන්නේ ය. එහෙයින් මෙය සද්කාර්යයක් වන්නේ.

අප මෙවර නන්දු මාලනි විශාරදවරිය කල්පනා කරන්නට වූවාය. "රෝශනත් දැන් ඔහේ නේද?"

"ඇත්තට ම සිසිර කාල වකවානුව හරියට ම දැනගන්න ඕනනම් රෝහණට කතා කළොත් හොඳයි. මොනවා වුණත් මම හරිම ආසාවෙන්, උනන්දුවෙන් ගායනා කරපු සින්දුවක්. ආදරයේ පැති දෙකක් ගැනනේ මහාචාර්යතුමා ලියලා තියෙන්නෙ..."

නන්දු මාලනිය රෝහණ නමින් හැඳින්වූයේ රෝහණ වීරසිංහ ප්‍රවීණ සංගීතවේදියාණන්ව. ගීය පිළිබඳව හෝඩුවාවක් දැනගනු රිසියෙන් ඒ වන විට කැන්බරා හි විවේක සුවයෙන් පසු වූ වීරසිංහයන් ඇමතීමු අපි.

"ඔය ගීතය කළේ අසූ දෙකේ. නැත්නම් අසූ තුනේ. මහාචාර්යතුමා ඉතින් දැනෙන්න ලියලා තියෙනවානේ. ඉතින් ඒ වචනවලට ඉබේම ආව තනුවක් තමයි යෙදුනෙ. වීරසිංහයන් ගීය පිළිබඳව අප දැනුවත්

ඇමතූයේ "ෆෝ-ඊ-බී" බ්‍රිස්බේන් ගුවන්විදුලියේ යෞවන වැඩසටහනේ "තොටුපොළ" අංශය වෙනුවෙන් සාකච්ඡාකිරීමට නියමිත "මගේ සඳ ඔබ" ගීතය පිළිබඳව වැඩි දුරටත් දැණුවත් වීමටයි.

"ඔය ගීතය ලිව්වෙ සුනිල් ආරියරත්න මහත්මයා. තනුව රෝහණගේ නේ. "රෝහණ කරපු තනු අතරින් මං අගය කරන ගීත දෙකෙන් එකක් තමයි "මගේ සඳ ඔබ" අනික තමයි "අහස සේ ඔබ අනන්තයි..." මාලනිය මදක් කළේ එලෙසින්. සුවදුක්,ආ-ගිය තොරතුරු පිළිබඳව පිළිසඳරකින් අපගේ සාකච්ඡාවන් නිමා කළේ ඔක්තෝබරයේදී නන්දු මාලනි යගේ ගී රස විඳීමට මෙල්බර්න් නුවරදී මුණ ගැසෙන බලාපොරොත්තු ඇතිවයි. ඒ ටී.එම්. ජයරත්නයන් ගේ ගායනා ද සමඟින් මුහුවන "ගිම්හාන රාත්‍රියේ" දී යි.

සිසර දිසානායක

